ඔබ කෝප නොවනු

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර් තා කරන ලදී: සැබැවින්ම මිනිසෙක්
නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට, ‘මට ඔබ උපදෙස් දෙනු මැනව!’ යැයි පවසා සිටියේය. එතුමාණෝ: “ඔබ කෝප නොවනු” යැයි පැවසූහ. ඔහු එසේ කීප වරක් ම විමසා සිටියේය. එතුමාණෝ: “ඔබ කෝප නොවනු" යැයි පැවසූහ. [صحيح] [رواه البخاري]

සහාබිවරයකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් තමන්ට ප්රයෝජනවත් වන යමක් කියා දෙන්නැයි විමසා සිටියේය. එවිට එතුමාණෝ ඔහුට කෝප නොවිය යුතු යැයි අණ කළහ. එහි තේරුම කෝපය උපදවන හේතුසාධකවලින් වැළකී සිටීම, කෝපය ඇති වූ විට තමන් පාලනය කිරීම හා එම කෝපය සමග ඝාතන, පහර දීම්, බැණ වැදීම් වැනි දැයින් ඉක්මවා ගොස් කටයුතු නොකිරීම. එම පුද්ගලයා තමන්ට උපදෙස් දෙන මෙන් වාර ගණනාවක්ම ආයාචනය කළ අතර නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඊට පිළිතුරු වශයෙන් "ඔබ කෝප නොවනු" යන ප්රකාශය හැර වෙනත් කිසිවක් ඔහුට පවසා සිටියේ නැත.

https://sunnah.global/hadeeth/si/show/4709